# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/61 – 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2017.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 2017 අංක 13 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

2017.09.26 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.10.31 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**සබරගමුව පළාතේ පළාත් සභාව**

**සබරගමුව පළාත් සභාවේ 2017 අංක 13 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය**

2017.09.26 වන දින සභා සම්මත කරන ලදුව 2017.10.31 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2017 අංක 13 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 නොවැම්බර් මස 14 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

1A – PG 3779 – 12 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාවේ,
2005 අංක 01, 2005 අංක 03 හා 2013 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්ති මගින් සංශෝධනය වූ 2004 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය.***

1). මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2017 අංක 13 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේය.

2). 2005 අංක 01, 2005 අංක 03 හා 2013 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්ති මගින් සංශෝධනය වූ 2004 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් 8333 යන අත්තිකාරම් ගිණුමේ සීමාවන්, මෙහි පළමු උපලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

පළමු උපලේඛනය

2005 - ඇස්තමේන්තු

**වෙනත් අත්තිකාරම් ගිණුම් කටයුතු**

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම් වල උපරිම සීමාව |
| ***වෙනත් අත්තිකාරම් ගිණුම්*** | | | | | | | |
| 29 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8333 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 10,000,000 | 3,610,000 | 5,000,000 | 500,000 |

12 - 208